# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1570/9 - 2008 ඔක්තෝබර් 07 වැනි අඟහරුවාදා - 2008.10.07

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. - බී. 3/92 II

### 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත

1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 34 වන වගන්තිය සමග කියවිය යුතු 64 වන වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

පාඨලී චම්පික රණවක,
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍ය.

2008 ඔක්තෝබර් මස 07 වන දින,
කොළඹ දී ය.

### නියෝගය

1993 නොවැම්බර් මස 26 වන දින අංක 794/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව වරින් වර සංශෝධිත පරිදි වූ 1993 අංක 1 දරන පතල් කැනීම් (බලපත්‍ර දීමේ ) නියෝග එහි 33 වන නියෝගයේ (4) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.-

"(4) විකුණුම්වලින් හෝ පතල් නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳව නිශ්චය කරන ලද වෙළෙඳ වටිනාකම අනුව හෝ අය කරන රාජ්‍ය භාග, ඛණිජ ද්‍රව්‍ය ආයෝජන ගිවිසුමෙහි අන්‍යාකාරයකින් සඳහන් වුවහොත් මිස, එම වටිනාකම් වලින් පහත දැක්වෙන ප්‍රතිශතයක් විය යුතු ය.

| | |
|---|---|
| අගනා ලෝහ වර්ග | - සියයට 6 |
| කර්මාන්ත සඳහා උපයෝගී කර ගනු ලබන ඛණිජ ද්‍රව්‍ය (අපනයන නොකරන ) | - සියයට 5 |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛණිජ ද්‍රව්‍ය (අපනයනික) | - සියයට 6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | - සියයට 4 |
| ගල් (අපනයනික පාෂාණ ) | - සියයට 6 |
| පදනම් ලෝහ සහ වෙනත් ලෝහ | - සියයට 5" |

10-526

1A - G 010291— 1,430 (2008/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.